# බුදු සව් දහම් පිළ

සුගතවංස භික්ෂු

සතපා සිව්පසින් සැම සිසු දරුවකුම
සත දනය කෙළෙන් වඩවා ගුණ දහම
නෙත පෑදුව හෙයින් බැති සිත් ඇතිව මම
ගොතලා කවි කුසුම් පුදනෙමි විලස මෙම

දහසක් රහතුනගෙ ලැබ සිරිපා පහස
මෙම ලක්පොළව මත පිරිසිදු වූ වෙසෙස
මහමෙවුනා උයනැ අනුරාපුර පෙදෙස
පිහිටා තිබේ දම්පිළ දම්කෙත විලස

මේ පරිසරය පුරවයි බැති බරින් සිත
පැමිණෙයි විහඟ නාදය අප සවන් වෙත
දෑසට ලැබෙන විලසට රස අඳුන් සෙත
නුදුරින් පෙනේ රන්මැලි සෑ රුවන් කොත

එළු සකු මගද තකු වියරණ දත් බැවිනි
බුදු දම නොම පැකිල දිවගෙහි ලෙල වමිනි
අදිපති නා සමිඳු සිසුනට දළ පෙමිනි
යහ මඟ කියා දෙති එහි තමනුත් යමිනි

පෙර රජ ඇමතියන් පණ වැනි කරපු අගේ
හෙළ දූය බුදු සසුන අවරට වැටුණ යුගේ
ගොඩගනු පිණිස ජනිතවු හෙළදිවෙහි මගේ
ඉටු දෙව් ඔබයි විටකදි අප සිතට නැගේ

සිසුවන් අතර ලැබ ඇත් යස කිතු නාදේ
ගුණ පුන් ඇදුරු උතුමන් ගෙන් වැඩ සැදේ
ජයගන්නට එතත් සුරගුරු කොට වාදේ
ඇදුරන් වෙතින් නිසැක ව ජයගොස වීදේ

ගුරු සිත නො රිදවන සිසුකැළ සුවිනීත
ගොරතර සසර පිළිබඳ ජනිතව බීත
විඳ ගනු පිණිස දුක් තොර නිවනෙහි සීත
හැසිරෙති බුදුපුතුන් විලසට අතිජාත

පැන විසඳුමට මිසදිටුවන් ඇති කරන
වැඩිකර ගනු පිණිස හිමිවරු දම් නුවණ
ගිය මඟ යමින් මහ පඬිවරු සිටි පොරණ
පෙළ පොත් බලති අටුවා ටීකා නයින

සඟනට සුදුසු නැති නොමකොට දෙතිස්කතා
සසුනට හිතැති හිමිවරු එහි දියුණ පතා
ලිහුමට දහම් ගැට ඇතිවන ගැඹුරු ඉතා
වැඩසිට කරති තැන් තැන්වල දැහැමි කතා

පෙළ පොත් රැගෙන සිසු හිමිවරු
සිතු අටියෙන්
ව න පො ත් කරති පෙර කල
පැවතුණ සැටියෙන්
දූ වු වො ත් යමකු ඔහුගේ
සිතුවිලි බැතියෙන්
ඉ පි ළෙ ත් නිසැකව ම එය
පවසමි කෙටියෙන්

සිදුහත් කුමරු මරසෙන් බිඳ බුදු වන්න
අදිටන් කොට එද සෙවනෙහි වැඩ උන්න
මහ බෝ දුමිඳු සාකාවට නමදින්න
පින පෑදී තිබේ සිසුනට මෙහි ඉන්න

නො අඩුව ඇති නිසා හිමිවරු සැදෑ සිත
සැම දින ඉටු කරති නො කඩව වතාවත
සලසන සේවයෙන් දම් පිළ අනාගත
ලෝකය සැම තැන ම බබළයි කසාවත

අඩුවන සඟ පිරිස පිරිහෙන සඟ විනය
නැතිවෙන දම් දැනුම හා සද්ද දනය
ළංවනු පිණිස දියුණට පත්වන දිනය
දම් පිළ නිසා වන සේවය අපමණය

දෙසමින් මිහිඳු හිමි සදහම් මදුර සෙරෙන්
මුළු ලක් දෙරණ අම සිලිලෙන් තෙමුව යුරෙන්
බණ උල්පත නිසා නැගී දම් පුවුව කෙරෙන්
නැවතත් ගලා යයි දම් ගඟ අනුර පුරෙන්

තෙවළා දහම් පිළිබඳ ලැබගෙන දැනුම
මෙරමාහටත් දෙන්නට නිවනින් හිවුම
පිට දේසයන්හි ද හිමිඳුන් සැරි සැරුම
සිදු වේ දහම් පිටය පවතින තුරුම

ගුණ නැණ දෙකම වැඩිවන යුරු එක ලෙසට
පොත පත උගන්වති දම් පිළැ සිසු වනට
සැම රැති කරති රුව හා සුවඳැති මලට
එලෙසට ලැබෙයි ගරු සරු ඒ වැනි අයට

මුල් තැන දෙමින් තෙවළා බුදු වදන් වෙත්
පෙර'පර දෙදිග බස් හා නෙක සමය මත
තකු නය වියරණ ද මෙහි ඉගෙනුමට ඇත
එහෙයින් පැවුම අන් තැනකට දෙවැනි නැත

කුල මල බේද හෝ ලක ඇති නිකා ගැන
දම් පිළැ සිසුහු නො තකා සිට එකා මෙන
ඉගෙනුම ලබාගනිමින් නිසි මගේ යන
හැසිරෙති සොයුරු දහමේ ඇති අගේ දැන

දම් දූතයන් ඇති කොට පිළිවෙත් සාර
සත්නට කියා දෙන්නට නිවනට පාර
සදහම් නිකේතනයෙන් මෙම මනහාර
යස ගොස පැතිර යයි සැම මොහොතක් නැර

පව් බර සතන් සදහම් වතුරෙන් නාවා
සාමය සතුට මින් සැමතැන පැතිරේවා
පුර පස තරිඳු ලෙස දියුණුව ඇති වේවා
දම් පිටයෙන් ලොවට ම සෙත සැල සේවා

★

'අලසො ගිහී කාමභොගී නසාධු
අසඤ්ඤතො පබ්බජිතො නසාධු
රාජා නසාධු අනිසම්මකාරි
යො පණ්ඩිතො කොධනො තං නසාධු' (ජා. 4. නි.)

අලස කම් සැප විඳින ගිහියා නොමැනවී
සංයමෙන් තොර පැවිදි තැන වුව නොමැනවී
විචාරය නැති රටේ රජ වුව නොමැනවී
පඬි වුවත් ඔබ තරහ යේ නම් නොමැනවී